**සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Sabaragamuwa Provincial Department of Education**

| | |
|---|---|
| **පළමු වාර පරීක්ෂණය - 2018**<br>**1 st Term Test 2018** | **9 ශ්‍රේණිය** |
| **භූගෝල විද්‍යාව I,II කොටස**<br>**Geography - I , II** | **කාලය පැය : 2**<br>**Two hours** |
| **ඇතුලත් වීමේ අංකය : ................................**<br>**නම : ...............................................................................** | **පන්තිය : ......................** |

I කොටස

**සියළුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.**
**අංක 0 1 සිට 05 තෙක් ප්‍රශ්න වලට අදාළ නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 . සාපේක්ෂ පිහිටීමට අනුව ආසියා මහාද්වීපයට නැගෙනහිරින් පිහිටා ඇති සාගරය කුමක්ද?
i. පැසිපික් සාගරය ii. ආක්ටික් සාගරය iii. ඉන්දියන් සාගරය iv. අත්ලාන්තික් සාගරය

02. ලෝකයේ වැඩිම ජනගහනයක් වෙසෙන ආසියාතික රට වන්නේ ,
i. ඉන්දියාව ii. ජපානය iii. පාකිස්ථානය iv. චීනය

03. ලොකයේ වඩාත් උසින්ම පිහිටා ඇති සානුව නම් කරන්න.
i. ඩෙකැන් සානුව ii. ටිබෙට් සානුව iii. සයිබීරියානු සානුව iv. පාමීර් සානුව

04. කැස්පියන් මුහුදට ගලාබසින ගංගාවක් වන්නේ ,
i. ගංගා නම් ගඟ ii. සින්දු ගඟ iii. යුරල් ගඟ iv. හොවැංහෝ ගඟ

05. නිවර්තන මෝසම් දේශගුණය පිහිටි රටක් වන්නේ
i. ශ්‍රී ලංකාව ii. ජපානය iii. ඉන්දුනීසියාව iv. චීනය

**අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශයන් හරි නම් ( ✓ ) ලකුණද වැරදි නම් ( ✗ ) ලකුණද ඉදිරියේ ඇති වරහන තුළ ලියන්න.**

06. ආසියා මහාද්වීපය හා යුරෝපා මහාද්වීපය වෙන්වන සීමාවක් ලෙස රතු මුහුද හැඳින්විය හැකිය. (............)

07. මහද්වීපයක්,සාගරයක් හෝ රටක් පදනම් කරගෙන ප්‍රදේශයක පිහිටීම දක්වීම සාපේක්ෂ පිහිටීම ලෙස හැඳින්විය හැකිය. (............)

08. අන්දමන් දූපත් ,නිකොබාර් දූපත් ,හා මාලදිවයින් දූපත් වර්ග ප්‍රමාණයෙන් ඉතා කුඩා දූපත්වලට උදාහරණයන් ලෙස දැක්විය හැකිය. (............)

09. ආසියා මහාද්වීපය උතුරු අක්ෂාංශ $10^{\circ}$ සිට උතුරු අක්ෂාංශ $80^{\circ}$ අතර කලාපයේ පිහිටා ඇත. (............)

10. හොවැංහෝ ,ඉන්දු නිම්න හා මෙසපොටේමියානු යන ලොව පැරණි ශිෂ්ටාචාර ආසියානු ප්‍රදේශය තුළ පිහිටි ශිෂ්ටාචාරයන්ය. (............)

**අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට අදාළ නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා තිත් ඉර මත ලියන්න.**

11. කර්කටක නිවර්තනය හා මකර නිවර්තනය අතර පිහිටි දේශගුණික කලාපය නිවර්තන ..........................දේශගුණික කලාපයට අයත්ය.

12. වෘකයා ,වලසා ,ගෝනා ,මුවා සහ ඇන්ටිලොප් වැනි සතුන් වැඩි වශයෙන් ජීවත් වන්නේ ...............................................වනාන්තරවලය.

13. ආසියානු කලාපයේ අඩුම ජන සංඛ්‍යාවක් ඇති රට වන්නේ ............................................යි.

14. ........................................හා ජපානය මොංගොලොයිඩ් නැමැති මානව වර්ගය ජීවත්වන රටවල් දෙකකි.

15. පාකිස්ථානයේ ප්‍රධාන කෘෂිකාර්මික වගා කන්න දෙක ..............................හා රාබි යනුවෙන් හැඳින්වේ.

(පතනශීලී ,උණුසුම් ,චීනය ,මාලදිවයින ,කාරිෆ් )

**අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

16. අක්ෂාංශ හා දේශාංශ අනුව කිසියම් ස්ථානයක හෝ ප්‍රදේශයක පිහිටීම නිශ්චිතව දැක්වීම කුමන නමකින් හැඳින්වේද ?..........................................

17. ශීත දේශගුණ කලාපයට අයත් කඳුකර දේශගුණ වර්ගයට අයත් ආසියානු ප්‍රදේශය කුමක්ද? ..................................................

18. ආසියානු කලාපයේ කෘෂිකාර්මික රටක් වශයෙන් හැඳින්වෙන ප්‍රධානතම රට කුමක්ද ? ....................................................

19. සම්පූර්ණයෙන්ම අමුද්‍රව්‍ය හා ඛනිජ තෙල් ආනයනය මත කර්මාන්ත පවත්වා ගෙන යන රට කුමක්ද ? ..............................................

20. ඩුබායි රටෙහි පිහිටි නිදහස් වෙළෙඳ වරායක් ලෙසද ,මැදපෙරදිග ප්‍රධාන අපනයන මධ්‍යස්ථානයක් ලෙසද වැදගත්වන වරාය නම් කරන්න. ..........................................................

## II කොටස

පළමුවන ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

01. (අ) සපයා ඇති ලෝක ආකෘති සිතියමේ පහත සඳහන් දේ ලකුණු කර නම් කරන්න.

එවරස්ට් කඳු මුදුන ,සින්දු ගඟ ,කැස්පියන් මුහුද ,ටෝකියෝ නගරය ,ටිබෙට් සානුව

(ලකුණු 05X2 =10 )

(ආ)සපයා ඇති ශ්‍රී ලංකා ආකෘති සිතියමෙහි පහත සඳහන් දේ ලකුණු කර නම් කරන්න.

කොළඹ ,පේදුරු තුඩුව ,නැගෙනහිර දේශාංශ 800 රේඛාව ,සංගමන් කන්ද තුඩුව ,දෙවුන්දර තුඩුව

(ලකුණු 05X2 =10 )

02. (i) ආසියා මහාද්වීපයට උතුරු දිශාවෙන් හා දකුණු දිශාවෙන් පිහිටි මහාද්වීප දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02 යි )

(ii) ආක්ටික් සාගරයට ගලා බසින ගංගා තුනක් නම් කරන්න.

(ලකුණු 03 යි )

(iii ) ආසියානු ප්‍රදේශය භෞතික හා මානුෂ වශයෙන් වැදගත් වීමට බලපෑ සුවිශේෂී ලක්ෂණ තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි )

03. (i) ආසියානු කලාපය තුළ පිහිටි විශාල විල් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි )

(ii) ආසියානු කලාපයේ,පිහිටි ලෝකයේ විශාල සානු තුනක් නම් කරන්න.

(ලකුණු 03 යි )

(iii ) ලෝකයේ ප්‍රධාන දේශගුණික කලාප තුන නම් කර ඉන් එක් දේශගුණ වර්ගයක් සැකෙවින් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි )

04. (i) ආසියා වේ ඉතාම අඩු උෂ්ණත්වයක් වාර්තා කරන නගරය හා ඉහළම උෂ්ණත්වයක් වාර්තා කරන නගරය පිහිටි රටවල් දෙක පිළිවෙලින් නම් කරන්න. (ලකුණු 02 යි )

(ii) නිවර්තන දේශගුණික කලාපයේ දක්නට ලැබෙන ප්‍රධාන දේශගුණ වර්ග තුනක් නම් කරන්න.

(ලකුණු 03 යි )

(iii ) වර්ෂාපතනයේ හා උෂ්ණත්වයේ වෙනස්කම් අනුව ලෝකයේ දක්නට ලැබෙන ප්‍රධාන වනාන්තර වර්ග තුනක් නම්කර ඉන් එක් වනාන්තර පිළිබඳව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි )

05. (i) කොකොසොයිඩ් නැමැති මානව වර්ගය ජීවත්වන ආසියානු කලාපය තුළ පිහිටි රටවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි )

(ii) ආසියාවේ වැඩිම ජන ඝනත්වයක් ඇති කලාප තුන නම් කරන්න.

(ලකුණු 03 යි )

(iii ) කෘෂිකාර්මික රටක් ලෙස පාකිස්ථානයේ වගා කෙරෙන බෝග වර්ග තුනක් නම් කර එරට කෘෂිකාර්මික අංශය වැදගත්වීමට වාරිමාර්ග පද්ධතිය බලපා ඇත්තේ කෙසේද යි කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි )

06. (i) ජපානයේ පිහිටි ප්‍රධාන මෝටර් රථ සමාගම් දෙකක් නම් කරන්න. (ලකුණු 02 යි )

(ii) ජපානයේ නිෂ්පාදිත මෝටර් රථ ලෝකයේ ඉදිරියෙන්ම සිටීමට බලපා ඇති කරුණු තුනක් සඳහන් කරන්න.

(ලකුණු 03 යි )

(iii ) ඩුබායි ආසියාවේ සේවා මධ්‍යස්ථානයක් ලෙස වැදගත්වීමට බලපාන හේතු තුනක් දක්වා ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි )

1. (අ) ප්‍රශ්නය සඳහා සිතියම




1. (ආ ) ප්‍රශ්නය සඳහා සිතියම

